# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2014 අගෝස්තු මස 01 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2014.08.04 දින නිකුත් කරන ලදී)**


## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 3.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 66අා වගන්තියේ (4) වන උප වගන්තිය ඉවත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එය (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනතට, (255 වන අධිකාරය වූ) නගර සභා ආඥා පනතට සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට කරන ලද සංශෝධනවලට ආනුශංගික වේ. එසේ ඉවත් කිරීම හේතු කොටගෙන ඇතිවන නීතිය බලපෑම වනුයේ, අයවැයක් හෝ පරිපූරක අයවැයක් අවස්ථාවෝචිත පරිදි මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් වෙත නැවත ඉදිරිපත් කිරීමේ දී 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතට පෙරාතුව මහනගර සභාව, නගර සභාව, හෝ ප්‍රාදේශීය සභාව විසින් අනුගමනය කරන ලද කාර්ය පටිපාටියට නැවත අවතීර්ණ වීම වේ.

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

එල්.ඩී.—ඕ. 3/2014.

### (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2014 අංක  දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය බලාත්මක විය යුතු ය.

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 66අා වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2012 අංක 22 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 66අා වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "මේ වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අවස්ථාවෝචිත පරිදි" යන වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි" යන වචන ආදේශ කිරීමෙන්";

(2) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.